සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අනාවරණ පරීක්ෂණය 2021

# නාට්‍ය හා රංග කලාව

6 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

## I - කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ස්වභාවික පරිසරයේ උදෑසන අසිරිය දක්වෙන ගීතයක් වන්නේ,

(i) දිය ගොඩ සැමතැන කිරි ඉතිරේ (ii) මල් පිපෙයි දෙනෙත් ඇරෙයි

(iii) නිල් අහස් තලේ අගේ (iv) මොනවද අම්මේ අකුරු ජාතියක්

02. ''අනුන්ට කැපූ වළේ තමන් වැටීම''

(i) ජන කතාවකි (ii) නාට්‍යයකි

(iii) කතන්දරයකි (iv) ටෙලි නාට්‍යයකි

03. නාට්‍ය පෙළ යනු,

(i) තිර පිටපතය (ii) කාර්මික පිටපතය

(iii) නාට්‍ය පිටපතය (iv) රංගාලෝක පිටපතය

04. නාට්‍ය පිටපතක වරහන් තුළ සඳහන් වන්නේ,

(i) චරිත (ii) සංවාද (iii) ගීත (iv) රංග විධාන

05. ''පුංචි අපට දූන් තේරෙයි'' ළමා නාට්‍ය නිෂ්පාදනය කළේ,

(i) ඩී. කුමාරගේ (ii) අමිතා රබ්බිඩිගල

(iii) පාලිත ලොකුපෝතාගම (iv) සෝමලතා සුබසිංහ

06. ''කොප්පර කොප්පර පිපිඤ්ඤා'' ගීතය ඇතුළත් ජන ක්‍රීඩාව වන්නේ,

(i) මේවර කෙළිය (ii) ලේන්සු හැංගීම (iii) පනා හැංගීම (iv) එළුවන් කැම

07. ''මහලු වී සිටියත්, රුවින් අඩු වී සිටියත්'' යන පද්‍ය පාඨය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,

(i) සිරිත් මල්දම (ii) ලෝවැඩ සඟරාව

(iii) සුභාෂිතය (iv) කාව්‍යශේඛරය

08. ''අමර ගියා දිව්‍ය ලෝකේ'' ළමා නාට්‍යය කාගේ නිර්මාණයක් ද?

(i) අමිතා රබ්බිඩිගල (ii) සෝමලතා සුබසිංහ

(iii) ඩී කුමාරගේ (iv) පාලිත ලොකුපෝතාගම

09. වේදිකා නාට්‍යයක අනුෂාංගික කලා අයත් වන්නේ කුමන අභිනයට ද?

(i) වාචික අභිනයට (ii) සාත්වික අභිනයට (iii) ආහාර්ය අභිනයට (iv) ආංගික අභිනයට

10. රංගනයක දී යොදා ගන්නා උපකරණ හඳුන්වන්නේ,

(i) නාට්‍යෝපකරණ නමිනි. (ii) වේෂ භූෂණ නමිනි.

(iii) වේදිකා පසුතල නමිනි. (iv) රංග වස්ත්‍ර නමිනි.

- **හිස්තැනට සුදුසු නිවැරදි වචනය තෝරා වාක්‍යය සම්පූර්ණ කරන්න.**

11. වේදිකා නාට්‍යයක් නරඹන්නා .......................................................................................... නම් වේ.

12. වේදිකා නාට්‍යක් ප්‍රේක්ෂකයා වෙත ඉදිරිපත් කරන මාධ්‍යය .............................................. නම් වේ.

13. යමක් පිළිබඳ අලුතින් සිතීම ..................................................................................... නම් වේ.

14. ආංගික අභිනය ප්‍රබල ලෙස භාවිතා වන්නේ .................................................................... කලාවෙහිය.

15. මනමේ නාට්‍යය ........................................................................................ නාට්‍යයකි.

(අභිරූපණ, ප්‍රේක්ෂකයා, පරිකල්පනය, ශෛලිගත, අභිනය)

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා දී ඇති ප්‍රකාශයන් හරිනම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද, ඉදිරියේ දී ඇති වරහන තුළ යොදන්න.**

16. චරිතයක් තුළ භූමිකා කිහිපයක් තිබිය හැකිය. (..............)

17. මිනිසාගේ මෙන්ම සතුන්ගේ හඬ තුළ ද විවිධ පරාස ඇත. (..............)

18. රූපණය යනු රූප සිතුවම් කිරීමයි. (..............)

19. වේදිකා නාට්‍යයක රංගාභරණ ප්‍රමාණයෙන් විශාල විය යුතුය. (..............)

20. රංගනයේ දී මනස හා සිරුර අතර සම්බන්ධතාවයක් නොමැත. (..............)

## II - කොටස

- **පළමු ප්‍රශ්නය සමඟින් ප්‍රශ්න 02 ට පිළිතුරු සපයන්න.**

01 (i) පුංචි අපට දූන් තේරෙයි නාට්‍ය කුමන වර්ගයේ නාට්‍යයක් ද? (ලකුණු 02)

(ii) එම නාට්‍යයේ එන චරිත 02ක් නම් කර එම චරිතවල දැකිය හැකි චරිත ලක්ෂණ 01 බැගින් ලියන්න. (ලකුණු 04)

(iii) එම නාට්‍යයෙන් සමාජයට දෙන පණිවිඩ 02 ක් නම් කර, එක් පණිවිඩයක් පිළිබඳ ඔබේ අදහස පැහැදිලි කරන්න. (ලකුණු 04)

02 (i) ඔබ දන්නා ජනකතා 02 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ජනකතා හා කතන්දර අතර දැකිය හැකි සමානතා 03 ක් ලියන්න. (ලකුණු 03)

(iii) ඔබ දන්නා ජන කතාවක් පැහැදිලිව ලියන්න. (ලකුණු 05)

03 (i) වෙස් මුහුණු සැකසීම සඳහා යොදා ගත හැකි ස්වභාවික ද්‍රව්‍ය 02 ක් ලියන්න. (ලකුණු 02)

(ii) වෙස් මුහුණු සැකසීමේ දී අවධානය යොමුකළ යුතු කරුණු 02ක් ලියන්න. (ලකුණු 02)

(iii) පන්ති කාමරයේ දී, ඔබ වෙස් මුහුණක් සැකසූ අයුරු ලියා සැකසූ වෙස් මුහුණෙහි රූප සටහනක් ඇඳ දක්වන්න. (ලකුණු 06)

04 (i) ස්වාභාවික පරිසරයේ දැකිය හැකි සංසිද්ධීන් 02 ක් ලියන්න. (ලකුණු 02).

(ii) සත්ව චරිත අනුකරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු 03 ක් ලියන්න. (ලකුණු 03)

(iii) පන්ති කාමරයේ දී ඔබ, ස්වභාවික සංසිද්ධියක් අනුකරණය කළ ආකාරය පියවර වශයෙන් ලියන්න. (ලකුණු 05)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | ii | 02 | i | 03 | iii | 04 | iv | 05 | iv | 06 | ii | 07 | i | 08 | iv |
| 09 | iii | 10 | i | 11 | ප්‍රේක්ෂකයා | 12 | අභිනය | 13 | පරිකල්පනය | 14 | අභිරූපණය | | | | |
| 15 | ශෛලිගත | 16 | ✓ | 17 | ✓ | 18 | ✗ | 19 | ✓ | 20 | ✗ | | | | |

## II කොටස

01 (i) ළමා නාට්‍යක් (ල. 02)

(ii) මල් පාත්තිය / මීයෝ 1, 2, 3, 4 / කුකුල් හාමි
ඉහත චරිත වලට අදාළ චරිත ලක්ෂණ වෙන වෙනම දක්වා ඇත්නම් ලකුණු දෙන්න.
නම් කිරීමට ලකුණු 02 යි. චරිත ලක්ෂණ දැක්වීමට ලකුණු 02 යි.

(iii) කම්මැලි නොවීම / තමන්ට නියමිත රාජකාරී නිසියාකාරව ඉටු කිරීම / උත්සාහය / අන් අය ඇගයීම ආදී ලෙස. (පණිවිඩ 02 ක් ලියා ඇත්නම් ලකුණු 02 යි. පැහැදිලි කිරීමට ලකුණු 02)

02 (i) අන්දරේ සීනි කෑ හැටි / හීල්බත් දංකුඩ / අනුන්ට කැපූ වළේ තමන් වැටීම / නාඩි බැලීම....... ආදී ලෙස 02 නම් කර ඇත්නම් (ල. 02)

(ii) කිසියම් සිද්ධියක් පදනම් වී තිබීම / නිශ්චිත කතෘ කෙනෙක් නොමැති වීම / චරිත ඇතුළත්ව තිබීම/ සරල සංවාද භාවිතය / ඕනෑම ස්ථානයක සිට කියවිය හැකිය. (ල.03)

(iii) ජනතාව පැහැදිලිව ලියා ඇත්නම් ලකුණු 05 ක් ලබා දෙන්න.

03 (i) පුවක් කොළපත් / දියපර කොළ / පොල් මටලු, බූ මටුලු / උණ කොළපු / ගංදෙල් කොළ ..... ආදී ලෙස ද්‍රව්‍ය 02 ක් ලියා ඇත්නම් (ල. 02)

(ii) සරල බව / චරිතයට ගැලපීම / නිර්මාණාත්මක බව / සමස්ත නිමාව / රංගනයට පහසුවක් වීම ආදී ලෙස කරුණු 02 ක් ඇත්නම් (ල. 02)

(iii) ශිෂ්‍යයා වෙස් මුහුණු සැකසූ ආකාරය පියවර වශයෙන් ලියා රූප සටහන ඇඳ ඇත්නම් ලකුණු 06 ක් ලබා දෙන්න.

04 (i) ගස් සෙළවීම / සත්ව චර්යා / වතුර ගලා යාම / වැස්ස / සුළඟ / අකුණු ගැසීම ..... ආදී ලෙස සිද්ධි 02 ක් සඳහා (ල. 02)

(ii) සතුන්ගේ නිවැරදි ගමන් විලාස / හැසිරීම් රටා / කටහඬ භාවිතය / ගොදුරර ඩැහැගන්නා ආකාරය / මිතුරු සබඳතා පවත්වන ආකාරය / සතුරු බලවේග සඳහා මුහුණ දෙන අයුරු ..... ආදී ලෙස ඇත්නම් (ල. 03)

(iii) සිසුවා තම අනුරණ ක්‍රියාවලිය සිදුකළ ආකාරය පැහැදිලිව ලියා ඇත්නම් ලකුණු 05 ක් ලබා දෙන්න.

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**අනාවරණ පරීක්ෂණය 2021**

**6 ශ්‍රේණිය** **නාට්‍ය හා රංග කලාව** **ප්‍රායෝගික පරීක්ෂණය**

01 ඔබ දන්නා කතන්දරයක් නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරන්න. (ල. 10)

02 සත්ව හෝ මිනිස් චරිතයක් අනුකරණය කරන්න. ඒ සඳහා පහත මාතෘකා යොදා ගන්න.

(1) දරුවන් නළවන මවක්
(2) පංතියට පරක්කු වී පැමිණෙන ශිෂ්‍යයා
(3) මීයෙකු පසුපස හඹායන පූස්රාළ
(4) රෙදි මසමින් සිටින මව
(5) අඹ ගෙඩියක් රස බලන වඳුරු පැංචා (ල. 15)

03 සාමූහික ක්‍රියාකාරකම් - ක්ෂණික නිරූපණ
කණ්ඩායම් ලෙස සැකසී පහත සිද්ධීන්වලින් ඔබ තෝරාගත් අවස්ථාවක් සාමූහිකව රඟ දක්වන්න.

(1) තද වැසි සහිත අවස්ථාවක්
(2) ක්‍රිකට් තරගයක්
(3) මළ ගෙදරක්
(4) වෙළඳ පළක්
(5) ගංවතුර දිනයක්
(6) රිය අනතුරක්
(7) උද්ඝෝෂණයක්
(8) දැඩි නියඟයක්
(9) කොරෝනා වසංගතය
(10) මාර්ගගත අධ්‍යාපනය ලබන මොහොතක්
(ල. 15)

04 පුංචි අපට දැන් තේරෙයි නාට්‍යයේ, ඔබ කණ්ඩායම මීට පෙර පුහුණු වූ, අවසථාවක් රඟ දක්වන්න. (ල. 10)

| | | |
|---|---|---|
| ලකුණු පිරිනැමීම | | |
| ලිඛිත පරීක්ෂය | - | 50 |
| ප්‍රායෝගක පරීක්ෂණය | - | 50 |
| සමස්තය | - | 100 |